# ඩෙන්ටාගේ චාරිකාව...




වෙයීරා ටෂානී සෙනෙවිරත්න

# ඩෙන්ටාගේ චාරිකාව


## වෙයීරා ටෂානී සෙනෙවිරත්න


කර්තෘගේ වෙනත් කෘති

- ආඩම්බර සඳුනි - 2024
- The Mysteries of Aurora’s Hollow- 2026


මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

8D



ISBN No- 978-624-211-057-8

# -පිදුම-

සතුරන්ගෙන්

ආරක්ෂා කරගනිමින්

දන්ත ධාතූන් වහන්සේ

සිරිලකට වැඩමකරවූ

හේමමාලා කුමරියට.....



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10



මගේ නම ඩෙන්ටා චාර්වක කිරී. මගේ ගෙදර තියෙන්නේ බබෙක්ගේ කටේ.

අපේ ගෙදර ගොඩාක් කට්ටිය ඉන්නවා. එයාලා එක එක වංශවල කට්ටිය. ඒ වංශ තමා කෘන්තක කිරී, රදනක කිරී, චාර්වක කිරී.

තව කට්ටියක් එන්නත් බලාගෙන ඉන්නවලු. එයාල එනකම් තමා අපි ඉන්නෙ. එයාලා අපිව තල්ලු කරගෙනම එනවලු. අපිට දිවයි විදුරුමසයි තමා කිව්වේ.

ආ... මට කියන්න බැරිවුනානෙ, රදනක වංශයේ හතර දෙනෙක් ඉන්නවා. කෘන්තක වංශයේ සහ චාර්වක

වංශයේ අට දෙනා ගානෙ ඉන්නවා. ඒ කියන්නේ අපේ ගෙදර හැමෝම විසි දෙනෙක් ඉන්නවා.

මං හිතන විදිහට මම ඉපදුනේ බබාට වයස අවුරුදු දෙකේදී විතර. ඊට කලින්  යට තල්ලේ කෘන්තක කිරීලා ඉපදිලා තියෙන්නෙ. අර මැද ඉන්න දෙන්නා ආවේ බබාට මාස හතේදී විතර ලු .ඊට පස්සෙ උඩ තල්ලෙ මැද ඉන්න කෘන්තකලා ආවෙ බබාට මාස නවයේදී ලු. එතකොට එයාලාට දෙපැත්තේ අය ආවෙ මාස දහයත් දහනවයත් අතර ලු. ඊට පස්සේ රදනක කිරීලයි අනිත් අයයි ආව ලු. ඒ බබාට මාස  දහහතත් විසිතුනත් අතර ලු.

ඊටත් පස්සෙ අන්තිමේටම ආවෙ මමයි මගේ චාර්වක කිරී සහෝදරියො කට්ටියයි.



මම හිතුවේ අපි හැමදාම මේ කටේ ඉඳියි කියලා. මෙන්න එතකොට බබාට වයස අවුරුදු 6න් විතර අපේ කෘන්තක දත් ටික යන්න ගියා, අපි එයාල ගියේ කොහෙද කියලා දන්නේ නෑ. ඒත් මට ඇහුනා ඒයාලව ලේනෙක්ට දුන්නා කියලා.

අපි හැමෝම හරිම දුකෙන් ඉන්නේ. ඊළඟ දවසේ බලනකොට මෙන්න කිරී කෘන්තකලා හිටපු තැන අලුත් යාලුවෝ ඇවිල්ලා. එයාලාගෙ වංශය කෘන්තක ස්ථීර ලු. ඔහොම ඔහොම එකින් එක මගේ කිරී යාලුවෝ ටික යන්න ගියා.



මමත් දැන් ටිකක් හෙලවෙනවා. මටත් යන්න වෙයිද දන්නෙ නෑ. මගේ කිරී යාලුවෝ හිටපු තැන්වල දැන් වෙනස් වෙනස් යාලුවෝ ඉන්නවා. මම එයාලාට කතා කළේවත් නෑ. ඒත් මට යන්න තව කල් තියනවා නේ.

දැන් නම් මම හොඳටම හෙලවෙනවා. අනේ......... මම වැටුනා නේද? මේ මොනවද රතු පාටට මම හිටපු තැනින් ගලන්නේ?






මම යනවා ආපහු ගෙදර. ඒ කියන්නේ මගේ අම්මයි තාත්තයි ඉන්න තැනට. මම හරි ආසාවෙන් ඉන්නෙ ආපහු ගෙදර යන්න. මේ මම කටකට ආපු පළවෙනි වතාව නේ.

කටේ හිටියා වගේ නෙවෙයි මම දැන් රෝස  පාට පාවෙන බෝලයක් වගේ පේන්නේ.

ඔන්න මම ආවා. "අම්මේ, තාත්තේ, අක්කේ මම ආවා."

"අනේ දුවේ ඔයා ගොඩක් ඉක්මනට ආවා නේද?"

"ඔව් අම්මේ මම කිරි දතක් වෙලානෙ ගියේ."




“අනේ නංගි ඔයාට ඊළඟ වතාවෙ ස්ථිර දතක් වෙන්න පුළුවන්.”

“ඇයි අක්කේ ඔයා එහෙම කියන්නේ?”

“ඉතිං ඔයා සතෙකුගේ කටකට යන්නෙත් නැතුව කිරි දත් විභාගය ලියලා ගියේ. ඒ වගේ ස්ථිර දත් විභාගෙත් ලියලාම බලන්න. ඔන්න මේ පාර මම ඔයා යන කටේ දිව වෙලා එනවා. ඒ වගේම ඒ යන කට මම යන අන්තිම කට වෙනවා”

“හ්ම්ම්.... එහෙනම් මම අනිවාර්යෙන් ම ස්ථිර දතක් වෙනවා මයි”

මම ගෙදර ගිහිල්ලා අවුරුද්දක් විතර නිවාඩුවක් ගත කළා. දැන් ඉතින් ආයෙත් දත් ඉස්කෝලෙට යන්න ඕනෙ. එහෙ අවුරුද්දක් ඉගෙනගන්නත් ඕනේ. ඊට පස්සෙ ලොකු විභාගයක් ලියලා ඒකේ ලකුණු ගන්න විදිහට තමා අපි ආපහු කටවල්වලට යන්නේ. මගෙ අක්කා කිව්වා වගේ ම මම යන කටේ ම දිව වෙලා එයි.



“අම්මේ, තාත්තේ මම යනවා” අම්මටයි තාත්තටයි වැඳලා මම දත් ඉස්කෝලෙට යන්න පිටත් වුනා.

මම කලින් ගිය ඉස්කෝලෙට නෙවෙයි මේ සැරේ යන්නේ. ඒක ගොඩාක් දුර ගමනක්.

මම අද යාලුවෙක්ගේ ගෙදර නැවතිලා ඉඳලා හෙට තමා යන්නේ. මගේ යාලුවා මම යන ඉස්කෝලේට නෙවෙයි යන්නේ. මම උදේ පහයි කාලට යන කෝච්චියේ තමා යන්නේ.

ඔන්න මම දුම්රිය ස්ථානයට ආවා. ටිකට් එකකුත් ගත්තා. දැන් වෙලාව උදේ පහයි. තව ටිකකින් මම යන කෝච්චිය එනවා.



මම කෝච්චියට නැග්ගා. එතන ලියලා තිබ්බා ‘වයිට් දන්ත පාසලට’ කියලා. මම තව ටිකක් වටපිට බලලා මගේ පුටුව කොහෙද කියලා හෙව්වා.

එතකොට එතන ඉන්න කෙනෙක් ඇහුවා “ කෝ ඔයාගේ ටිකට් එක” කියලා.

මම මගේ ටිකට් එක පෙන්නලා කිව්වා “ මෙන්න මගේ ටිකට් එක”.

“අනේ ඔයා මම ඉඳගන්න ඕනෙ තැන දන්නවා ද?”

ඊට පස්සේ මට හිතාගන්නවත් බැරි දෙයක් තමා සිද්ධ වුණේ. එයා කිව්වා “ ඔයාට වැරදීමක් වෙලා, ඔයා ඉඳගන්න ඕනැ මෙතන නෙවෙයි. වයිට් දන්ත පාසලට මෙහෙ ඉඳලා යන්න දවස් දෙකක් යනවා, ඔයාට  දවස් දෙකක් ඉඳගෙන යන්න බැනෙ, මේ ටිකට් එකට අනුව ඔයා අර කොණේ ම තියෙන කාමරේට යන්න.”


කවදාවත් කෝච්චියක එච්චර දුර ගමනක් ගිහින් නැති මම

“ කාමරයක් මට?” කියලා ඇහුවා.

ඊට පස්සෙ කිව්වා

“ ඔව්. ඔයාට ඒ කාමරේ ඕනෙ පහසුකමක් තියෙනවා. අපි පාසලට ගියාට පස්සෙ ඔයාට කතා කරන්නම්” .

එයා යන්න ගියා. මම කොණේ ම කාමරේට ගියා. මම හිතුවෙ නෑ මට කාමරයක් ම හම්බවෙයි කියලා.



මම මුලින් ම ගෙදරින් ගෙනාපු බත් එක කන්න පටන් ගත්තා.

බත් එක කන ගමන් මම ජනලයෙන් එළිය බැලුවා. හරිම ලස්සනයි, අපි කැලයක් මැදින් යනවා වගේ.



ලොකු ගස්වැල් ගොඩාක් තිබ්බා. ඒවා අහසෙ ගෑවෙන තරම් උසයි.

කාලා ඉවරවෙලා මම ඇඳේ හාන්සි වෙලා කතන්දර පොතක් කියවන්න ගත්තා.

එකපාරට ම මට බඩගින්නක් ආවා. බලද්දි හොඳට ම රෑ වෙලා.මගේ රෑ කෑම එක මේසෙ උඩ තිබුණා. මම රෑට කාලා  පොඩ්ඩක් වෙලා අහස දිහා බලාගෙන හිටියා. මට හොඳට ම නින්ද ගිහිල්ලා.

මම ඇහැරිලා බලද්දි අපි ලස්සන මල් වත්තක් මැදින් යනවා වගේ. මල් ගොඩාක් පිපිලා, සමනල්ලුත් පියාඹනවා.



නොදැනීම හවස් වෙලා. මම ඇඟ ටිකක් හෝදගෙන අලුත් ඇඳුමක් ඇඳගත්තා. හෙට උදේ වෙනකොට අලුත් ඉස්කෝලෙට යන්න පුලුවන්.

මම පාසල් නිල ඇඳුම ලෑස්ති කරලා තිබ්බා. අපිට පොත් එහෙන් ම දෙනවා කියලා කිව්වා.

මට ඉස්කෝලෙට යනකම් ඉවසීමක් නෑ. මම රෑට කෑම කාලා නිදාගත්තා.

මම අද ටිකක් කලින් නැගිට්ටා. ලස්සනට ඉර පායලා. ලස්සන මල් වත්තක් පේනවා. ඒකේ මම වගේ තව කට්ටිය සෙල්ලම් කරමින් හිටියා. ලොකු පිට්ටනියක් මැද උස ගොඩනැගිල්ලක් පේනවා.



එතකොට කවුදෝ ඇවිත් මට කතා කරලා කිව්වා "ඔයා දැන් බහින්න ලෑස්ති වෙන්න" කියලා.

මම මගේ පාසල් නිල ඇඳුම ඇඳගෙන ඉක්මනට ලෑස්ති වුණා. අම්මාට කෝල් එකක් අරගෙන කිව්වා දැන් මම ඉස්කෝලෙට ආවා කියලා. අම්මා කිව්වා තව සතියකින් අක්කා මාව බලන්න එනවා කියලා.

මම කෝච්චියෙන් බැස්සා. මාව එක්කරගෙන යන්න ටීචර් කෙනෙක් ඇවිත් හිටියා. මගේ පංතියේ ළමයි ගොඩාක් හිටියා.



ටීචර් මගෙන් ප්‍රශ්න ටිකක් ඇහුවා.

"ඔයා ඊළඟ කටේදී මොන දතක් වෙලා ද යන්නේ?"

"ස්ථිර දතක් වෙලා" මම බයෙන් වගේ කිව්වා.

"හොඳයි. හැබැයි ඔයාට මහන්සි වෙන්න වෙනවා. ඔයා දන්නවා ඇති මේ පාසලේ ඉන්න හැමෝම බලාපොරොත්තු වෙන්නේ ස්ථිර දතක් වෙන්න. ඉතින් ඒ විභාගය අසමත් වුනොත් ආපහු කිරි දත් පාසලටයි යන්න වෙන්නේ."එයා කිව්වා.

මම මගේ පන්තියට ගියා. අපිට ඉගෙනගන්න තියෙන්නේ අවුරුද්දයි. අපි හැමෝට ම පොඩි කාමරයක් තියෙනවා. කෑම කනකොට හැමෝම එක තැනක කන්නේ.

මගේ අක්කා කිව්වා වගේ ම සතියකින් මාව බලන්න ආවා. එයා දිවක් වෙන විභාගය ලිව්වා කිව්වා. එයාට මම යන කටට ම යන්න පුළුවන් කිව්වා. මටත් හොඳට විභාගය ලියන්න කිව්වා.

මම අලුත් ඉස්කෝලෙ අවුරුද්දක් ඉගෙන ගෙන ස්තිර දත් විභාගය ලිව්වා. ඒක ටිකක් අමාරුයි කියලා මගේ අනිත් යාළුවෝ කිව්වා. ඒත් මට නම් ඒක අමාරු නෑ.




ප්‍රතිඵල ආවා. ඒත් මට මගේ ලකුණු හම්බුනේ නෑ. මම විදුහල්පතිතුමිය ළඟට ගිහින් මගේ ලකුණු ඇහුවා. එයා මගේ ලකුණු කිව්වෙ නෑ. ඔයා හෙට උදේ දහයට හරියටම මෙතනට එන්න කියලා කිව්වා. මම දුකින් මගේ කාමරයට ගියා.

අනිත් අය ලකුණු ලැබිලා සතුටින් හිනාවෙනවා මට ඇහෙනවා. මට හරිම දුකයි. මට හෙට එන්න කිව්වේ මම සමත් නෑ කියලා කියන්න ද දන්නේ නෑ. මට කිරිදත් ඉස්කෝලෙට යන්න වෙයි ද දන්නෙ නෑ. හොඳටම ලකුණු අඩුයි නම් මට සතෙක්ගේ කටකට යන්න වෙයි ද? මාව එලවයි ද? මම අහලා තියෙනවා ලකුනු අඩු අය ගෙදරත් යන්නේ නැතුව නරක් වෙනවා ලු. එයාලා කටවල්වලට හොරෙන් ගිහින් දත් නරක් කරනව ලු. අනේ මටත් එහෙම වෙයි ද? නෑ, එහෙම වෙන්නේ නෑ.

මම රෑ කෑම කන්න ගියා. හැමෝම මගේ දිහා කන්න වගේ බලාගෙන ඉන්නවා. මම ඉතින් ඉක්මනට කාලා ඉවර කරලා මගේ කාමරයට ගියා. එතකොට මට ඇහුණා කවුරුහරි අහනවා,

"ඔයා දන්නවාද ඩෙන්ටාගේ ලකුණු?"

"නෑ. ඒක වැඩක් නෑ, හැමෝම දන්නවානේ වැඩි ම ලකුණු තියෙන්නේ ක්ලෝව් ට කියලා."


"ඔව් ඒත් ක්ලෝවිට වඩා ඩෙන්ටා හොඳට වැඩ කරා නේද?"

"අනේ අපි මොකට ද එයා ගැන හිතන්නේ. එයා තව ටික දවසකින් අඩ අඩ සතෙක්ගේ කටකට යයි. අපි යමු නිදාගන්න."

මට ඒ ඔක්කොම ඇහුණා. එයාලා කියන්නෙ ඇත්ත ද දන්නේ නෑ. ක්ලෝවි කියන්නේ මගේ හොඳම යාළුවා. එයා දන්නේ නැති දේවල් අහගත්තෙත් මගෙන්. මම දැන් නිදාගන්නවා. හෙට මොනවාහරි වෙයිනෙ.




මම හරිම අමුතු හීනයක් දැක්කා. ඒ කට්ටිය මාව ඇදගෙන එළියට තල්ලු කරා. මම කොච්චර කෑගැහුවත් කාටවත් ඇහුනේ නෑ. මම වැටුණා නරක් වුණ දත් ඉන්න තැනට එක්කෙනෙක් මට ගහන්න යනකොට ම මම එක පාරටම ඇහැරුණා.



හොඳ වෙලාවට ඒක හීනයක් විතරයි. මගේ අම්මා කියලා තියෙනවා හැම හීනෙකම තියෙන දේවල් ඇත්ත නෙවෙයි කියලා. හැබැයි මම ඒ හීනය ගැන ක්ලෝවිට කිව්වාට පස්සේ එයා කිව්වා එයා දැකපු ඔක්කොම හීන ඇත්ත වෙලා තියෙනවා කියලා.

වෙලාව ටික ටික ගියා දැන් නවයයි පනහයි. තව විනාඩි දහයයි තියෙන්නේ. අනේ මන්දා. මම ගියා විදුහල්පතිතුමියගේ කාමරයට. එයා කිව්වා "ඩෙන්ටා, ඔයා දන්නවාද ඔයාව මෙතනට ගෙනාවෙ ඇයි කියලා? ඔව් මම දන්නවා ඔයා ඒක දන්නෙ නැති බව. ආ....මෙන්න මේ ලියුම ඔයාම කියවල නබලන්නකො."

මම ලියුම කියෙව්වා ඒක ගෙදරින් එවපු ලියුමක්.

*"දයාබර ඩෙන්ටා,*

***ඔයා හොඳට වැඩ කරලා තියෙන බව අපිට දැනගන්නන්ට ලැබුණා. ඔයාට හොඳටම පුදුම හිතෙයි. මම ප්‍රධාන ශාලාවේ ඉන්නවා.***

***මීට අක්කා"***

මම ප්‍රධාන ශාලාවට ගියා. මගේ අක්කා එතන හිටියා මට හිතාගන්නවත් බෑ.

එයා කිව්ව "ඔයා තමා විභාගෙන් වැඩි ම ලකුණු අරගෙන තියෙන්නේ. ඔයාට යන්න කැමති කටට කැමති වංශයක් තෝරගන්න ඔයාට ම පුළුවන්...."

එයා දිවක් වෙන විභාගයේ උපාධිය අද ගන්නේ. මම ස්ථිර දත් උපාධිය අද ගන්නේ. අපි දෙන්නා ම එකම කටට යන්න පුලුවන්. ඉතින් දැන් මම කෘන්තක දතක් වෙන්න පුලුවන්. අක්කාට ඒ කටේ දිව වෙන්න පුලුවන්.

අපි දෙන්නාම ගෙදර ගියා. අම්මයි තාත්තයි ගොඩාක් සතුටු වුණා. අපි කටකට යන්න ලෑස්ති. අක්කා මට කලින් ගියා මොකද එයා දිවක්නේ. කටක කිරි දත් එන්නත් කලින්නේ දිවක් එන්නේ. මමත් අක්කා ගිය කටට ම ගියා.

ඔයාලත් දතක් ගැලවුනොත් බලන්න ඒකට පණ ඇවිත් කොහෙට ද යන්නෙ කියල



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN No-978-624-211-057-8